# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/41 - 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2016.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) අනු ව්‍යවස්ථාව යටතේ ඉඩම් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) අනුව්‍යවස්ථාව ප්‍රකාරව 2016 අගෝස්තු මස 10 වන දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ඉඩම් රාජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 අගෝස්තු මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය.

උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| 1. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම්කරණය<br>2. ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු<br>3. ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු<br>4. II වැනි තීරුවේ දැක්වෙන දෙපාර්තමේන්තු අධීක්ෂණය කිරීම හා මෙහෙය වීම<br>5. III වැනි තීරුවෙහි දැක්වෙන පනත් ක්‍රියාත්මක කිරීම | 1. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව<br>2. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | * ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20)<br>* හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (1998 අංක 21) |

09 - 272


1A - G 24087 — 359 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*